<u>සිගිරියෙන් සිහිවන යක්ෂ උරුමය</u>

සුර අසුර යුද්ධය ආදිය පිළිබඳ ව නැවතත් වෙනත් අයුරකින් කල්පනා කිරීමට කාලය පැමිණ ඇත. ඕනෑම ඉතිහාසයක් ලියනු ලබන්නේ ජයග්‍රහකයන් විසින් යැයි කියනු ලැබෙයි. විවිධ පුරාණ ග්‍රන්ථ ලියනු ලැබ ඇත්තේ වෛදිකයන් විසින් බව පැහැදිලි ය. සුරයන් අසුරයන් පැරදවූ පුවත් මේ ග්‍රන්ථවල බහුල ය. සුරයන් විසින් පරදවනු ලැබූ අසුරයන් සුරලොවින් පිට කෙරී ඇත. මෙහි දී සිදුවන්නට ඇත්තේ කුමක් ද යන්න පැහැදිලි කරගැනීමට ඉරානයේ හෝ ඒ අවට හෝ අවුරුදු තුන්හාරදාහකට පෙර සිදු වූයේ කුමක් ද යන්න නැවතත් අධ්‍යයනය කළ යුතු ය. කවුරුන් වුවත් ඉදිරිපත් වී එසේ කරන තුරු අපට කළ හැක්කේ ඒ පිළිබඳ අනුමාන කිරීම පමණ ය.

අසුර යන්න අහුරාමස්දා සමග සංසන්දනය කෙරෙයි. පුරාණ ග්‍රන්ථවල අසුරයන් පහත් ජීවීන් ලෙස සැළකුව ද ඉන් ඉහත ලියන ලද ග්‍රන්ථවල සුරයන් හා අසුරයන් සමානත්වයෙන් සැළකේ යැයි කියනු ලැබේ. ඉන් පැහැදිලි වන්නේ පුරාණ ග්‍රන්ථ ලියා ඇත්තේ සුරයන්ගේ ජයග්‍රහණයෙන් පසුව බව ය. සුර අසුර යුද්ධයෙන් කියැවෙන්නේ සුරයන් හා අසුරයන් අතර වූ යුද්ධයකට වඩා සුරයන් තම දෙවියන් ලෙස පිළිගත් ජන කොටසක් හා අසුරයන් තම දෙවියන් ලෙස පිළිගත් ජන කොටසක් අතර වූ යුද්ධයක් යැයි සැලකිය හැකි ය.

අසුරයන් තාවතිංසයෙන් පහතට ඇද දමනු ලැබුයේ ශක්‍ර දේවේන්ද්‍රයන් විසින් යැයි කියනු ලැබේ. එයට හේතුව අසුරයන් පමණට වඩා සුරාව පානය කිරීම නිසා යැයි ද කියනු ලැබෙයි. අසුරයන් යනු යක්ෂයන්ගේ දෙවියන් ලෙස ගතහොත් හා සුරයන් යනු ආර්යයන්ගේ (වෛදිකයන්ගේ) දෙවියන් ලෙස ගතහොත් සුර අසුර යුද්ධයෙන් කියැවෙන්නේ යක්ෂයන් ආර්යයන් අතින් පරාජය වී තමන් ආර්යයන් සමඟ එකට ජීවත් වූ ප්‍රදේශයකින් පළවා හරිනු ලැබුම යැයි සිතිය හැකි ය.

මේ එකට ජීවත් වූ ප්‍රදේශය වත්මන් ඉරානය අවට ප්‍රදේශයක් යැයි සිතිය හැකි ය. පන්නනු ලැබූ යම් පිරිසක් ඉරානයේ ද තවත් පිරිසක් දඹදිව හා ලංකාවේ ද ලැගුම් ගත්තේ යැයි සිතිය හැකි ය. ඉරානයේ දී යක්ෂ ගෝත්‍රිකයන් අතින් අහුරාමස්දා සංකල්පය මෙන් ම දේව සංකල්ප ද වර්ධනය වන්නට ඇත. යක් හෙවත් යාඥා කළ පිරිසක් වූ යක්ෂ ගෝත්‍රිකයන්ගෙන් ඇතැමුන් දෙවියන් සමග සම්බන්ධකම් පවත්වන්නට ඇති ඉඩකඩ වැඩි ය. දඹදිව හා ලංකාවේ ද පදිංචි වූ යක්ෂ ගෝත්‍රිකයන් ද ඉන්ද්‍ර ආදී දෙවියන් සමග දිගින් දිගට ම සම්බන්ධකම් පවත්වාගෙන යන්නට ඇතැයි සිතිය හැකි ය.

පසු කලෙක ඉහත කී ප්‍රදේශයෙන් ආර්යයන් ද දඹදිවට සංක්‍රමණය වී ඇති බව පැහැදිලි ය. මේ වන විට යක්ෂ ගෝත්‍රිකයන්ගේ ඉන්ද්‍ර, ආර්යයන්ගේ දේවේන්ද්‍ර හෙවත් ශක්‍ර දේවේන්ද්‍ර බවට පත් වී අවසාන යැයි සිතිය හැකි ය. අසුර යන වචනයෙහි ඇත්ත ගුණගරුක භාවය ආදී තේරුම් තිබේ යැයි කියැවෙයි. එහෙත් සුරයන්ගේ ජයග්‍රහණයෙන් පසුව අසුර හා යක්ෂ යන වචනවලට පහත් අසත්, විරූපී ආදී තේරුම් දෙන්නට ඇත. යක්ෂණියන් යකිනියන් පැහැපත් රූමැති කාන්තාවන් යැයි කියැවෙන බව අපි සීගිරිය ගැන සාකච්ඡා කරද්දී පැවසුවෙමු. කාශ්‍යප රජුට තිබූ යක්ෂ සම්බන්ධය (මවගෙන් උරුම වූ) හේතුකොටගෙන සීගිරි චිත්‍රවලින් මූලිකව දැක්වෙන්නේ යක්ෂ කාන්තාවන් (කුමරියන්) යැයි අපට විශ්වාස කළ හැකි යැයි අපි කීවෙමු.

ඉන්ද්‍ර දෙවියන්ගේ භාර්යාව ඉන්ද්‍රාණී වෙයි. අජන්තා බිතු සිතුවම්වල, විශේෂයෙන් ම එහි 17 වැනි ගුහාවෙහි ඉන්ද්‍ර හා ඉන්ද්‍රාණීගේ සිතුවම් ඇත. ඒ ගුහාවෙහි ම සිංහල වෙළෙන්දාගේ කතාව ද චිත්‍රයට නැගී ඇත. ඉන්ද්‍රට හා ඉන්ද්‍රාණීට ආකාරයේ ඔටුණු නොමැති වුව ද සීගිරි කතුන් ට ද යම් ආකාරයක ශීර්ෂ පළඳනා වෙයි. ඉන් කියැවෙන්නේ මේ කාන්තාවන් එක්කෝ කුමාරිකාවන් නැත්නම් භූමාටු හෝ රුක් හෝ යක්ෂ දෙවඟනන් විය හැකි බව ය. අහසේ සිටින්නාක් මෙන් ඇඳ ඇති බැවින් ඔවුන් යක්ෂ භූමාටු හෝ රුක් හෝ දෙවඟනන් වීමට ඇති ඉඩකඩ වැඩි ය.

මෙහි දී කිවයුතු වැදගත් කරුණක් වෙයි. බෞද්ධ සාහිත්‍යයෙහි යක්ෂ දෙවියන් මුළුමනින් ම අමතක කර නැත. හින්දු සාහිත්‍යයෙහි මෙන් යක්ෂ දෙවිවරුන්ගේ තත්වය පහතට දැමීමක් බුදුන් වහන්සේ අතින් සිදු වී නැත. එහෙත් පසු කලෙක වෛදික බලපෑම් හේතුවෙන් මේ දේව ගණයාගෙන් බොහෝ දෙනකු භූමාටු, රුක් හා වෙනත් එවැනි දෙවියන් ලෙස සැලකෙන්නට ඇතැයි සිතිය හැකි ය. ඒ අතර වෛදිකයන් විසින් ඔවුන්ගේ දේව ගණයාට ඇතුල් කරගනු ලැබූ යක්ෂ දෙවියෝ ද වෙති. ශක්‍ර දේවේන්ද්‍රයන් පමණක් නොව පද්මපානී දෙවියන් ද පද්මාවතී හා

© Prof. Nalin De Silva

සරස්වතී දෙවඟනෝ ද එසේ වෛදිකයන් විසින් අවශෝෂණය කරනු ලැබ තමන් අතර රඳවා ගනු ලැබූ දේව ගණයා අතර වෙති.

මෙහි දී සීගිරිය ගැන වචනයක් දෙකක් නොකියා ම බැරිය. අපේ ප්‍රවාදවල පළවන්නේ අවසාන වාක්‍ය නො වේ. මේ ප්‍රවාද විටින් විට වර්ධනය වෙයි. අදහස් හා දත්ත ලැබෙන පරිදි ප්‍රවාද වර්ධනය වීම හා වෙනස්වීම ප්‍රවාදවල ස්වභාවය වෙයි. අප දෙවියන් ගැන අධ්‍යයනය කරන්නට පළමුව සීගිරි කතුන් ගැන සිතුවේ එසේ නිරූපණය වී ඇත්තේ යක්ෂ කාන්තාවන් කියා ය. එහෙත් අද අප සිගිරි කතුන් ගැන සිතන්නට පෙළඹෙන්නේ ඔවුන් යක්ෂ භූමාටු හෝ රුක් හෝ දෙවඟනන් ලෙස ය.

ගැමුණු රජතුමා රුවන්වැලි සෑය ඉදිකිරීමේ දී ඒ බිමෙහි සිටි රුක් දෙවඟනක් වූ ද එක් ගෝත්‍රයක (යක්ෂ වැනි වෙනත් ගෝත්‍රයක - නාග ගෝත්‍රයෙහි) වැඳුම් පිදුම් ලත් රත්නවල්ලී දෙවඟනට ගසින් බැස යන ලෙසට ආරාධනය කළ බවටත් කළගුණ සැලකීමක් ලෙස රත්නවල්ලී දෙවඟන නමින් චෛත්‍යය බැඳීමට එකඟ වූ බවටත් කතාපුවතක් අපේ සාහිත්‍යයෙහි ඇත. රුවන්වැලිය පසුව රුවන්මැලිය හෙවත් ස්වර්ණමාලී වුවත් එහි මුල් නම රත්නවල්ලී හෙවත් රුවන්වැලි වෙයි.

එපරිදි ම අද සීගිරියට සිංහගිරිය යැයි කීව ද එහි මුල් නම සිහිගිරිය වෙයි. ඒ පසුව සීගිරිය ද සිංහගිරිය ද වී ඇත්තේ වෛදික බලපෑම් හේතුකොට ගෙන යැයි සිතිය හැකි ය. සිහිගිරිය යන්නෙන් මතක් කරන ගිරිය යන තේරුම ගෙන දෙයි. කාශ්‍යප රජුට මතක්කිරීමට හෝ මතක්කර ගැනීමට හෝ අවශ්‍ය වුයේ කුමක් ද? කාශ්‍යප රජුගේ මව යක්ෂ ගෝත්‍රයට අයත් යැයි කියැවෙයි. මවගෙන් ඔහුට උරුම වූ යක්ෂ සංස්කෘතියක් තිබෙන්නට ඇත. කාශ්‍යප රජුට සිහිකිරීමට අවශ්‍ය වුයේ යක්ෂ සංස්කෘතිය ද? යක්ෂ යටගියාව ද?

අපට සිතෙන්නේ කාශ්‍යප රජු සිහිගිරිය නිර්මාණය කෙළේ යක්ෂ සංස්කෘතිය සිහිගැන්වීමට කියා ය. ඒ වනවිට යක්ෂ සංස්කෘතිය ක්‍රමයෙන් දුර්වල වනු කාශ්‍යප රජුට හා අනෙක් යක්ෂ ප්‍රධානීන්ට පෙනෙන්නට ඇත. ඒ නැතිවෙමින් පැවති යක්ෂ සංස්කෘතිය එදාටත් පසුවටත් සිහිගන්වනු සඳහා සිහිගිරිය කරවන්නට ඇතැයි ද සීගිරි චිත්‍ර යක්ෂ දෙවඟනන්ගේ චිත්‍ර යැයි ද සිතන්නට ඉඩ ඇත. සීගිරි උද්‍යානයේ සැකැස්ම සහ ඉරානයේ (පර්සියාවේ) උයන් සැකැස්ම අතර සමානත්වයක් දැකිය හැකි ය. පර්සියාවේ යක්ෂ ගෝත්‍රිකයන් වාසය කළ බවට සාක්ෂි වෙයි. සිහිගිරිය යක්ෂ සංස්කෘතිය සිහිගන්වන ස්ථානයක් ලෙස අපට දැකිය නොහැකි ද?

මෙහි දී පරණවිතාන මහතා සීගිරි කාශ්‍යප රජු ගැන කියා ඇති මතය අමතක නොකළ යුතු ය. ඒ මහතාට අනුව සීගිරි කාශ්‍යප රජතුමා ජීවත් වී ඇත්තේ කුවේර මෙනි. කුවේර යනු දේවත්වයට පත් යක්ෂ ප්‍රධානියෙකි. පරණවිතාන මහතා මෙහි දී යක්ෂ සංස්කෘතිය අනුව ජීවත්වීමක් ගැන සඳහන් නො කරයි. ඒ මහතා කාශ්‍යප රජු සහ කුවේර ගැන කියන්නේ සංස්කෘතික අර්ථයකින් නො වේ. එහෙත් පරණවිතාන මතය අප වෙනත් අයුරකින් වර්ධනය කළහොත් ඉන් කුවේරගේ හා කාශ්‍යප රජුගේ සංස්කෘතිය ගැන යමක් කියැවෙන බව පෙනී යයි.

කාශ්‍යප රජුට අවශ්‍ය වන්නට ඇත්තේ කුවේර මෙන් ජීවත්වනවාට වඩා හැකිතාක් යක්ෂ සංස්කෘතියෙහි ජීවත්වීමට ය. පරණවිතාන මහතා ඒ බව දැක ඇත්තේ කාශ්‍යප රජු කුවේර මෙන් ජීවත්වීය යනුවෙනි. සිහිගිරිය යන්න සීගිරිය ලෙස නොගෙන සිහිකරන ගිරිය ලෙස සැළකී නම් පරණවිතාන මහතාට ද අසන්නට වන ප්‍රශ්නය වනුයේ කුමක් සිහිකිරීමට ද යන්න ය. මෙරට යක්ෂ සංස්කෘතිය මහසෙන් රජුගෙන් පසුව ඉතාමත් දුර්වල වන්නට ඇතැයි සිතිය හැකි ය. ධාතුසේන රජුගේ අවධිය වන විට ද යක්ෂ සංස්කෘතිය යම් පමණකට දුර්වල වී තිබූ බව ද ඒ රජුට දාව යක්ෂ කාන්තාවකගේ කුසෙන් උපන් කාශ්‍යප රජුට යක්ෂ සංස්කෘතියට අනුව ජීවත්වීමේ අවශ්‍යතාවක් තිබෙන්නට ඇතැයි ද සිතිය හැකි ය.

අපේ ඉතිහාසය පිළිබඳ කරන අධ්‍යයනයන්හි යක්ෂ උරුමය ගැන අප දක්වන උනන්දුව කිසිසේත් ම ප්‍රමාණවත් නො වේ. යක්ෂ ගෝත්‍රිකයෝ ද්‍රවිඩයෝ නො වූහ. එහෙත් අපි ඇතැම්විට යක්ෂ ගෝත්‍රිකයන්ට ද්‍රවිඩ වර්ගයක් වූ දෙමළ යන්න පටබැඳ ඒ නිසා අවුල් ඇතිකර ගෙන ඇත්තෙමු. මේ සම්බන්ධ හොඳම උදාහරණය එළාර රජු වෙයි. අපි එළාර රජු දෙමළ යැයි කියමු. එයින් සිදු වී ඇත්තේ ලංකාවේ එළාර යුගයට යන දෙමළ ඉතිහාසයක් ගැන කීමට මහාවංසය ම යොදා ගැනීම ය. එහෙත් එළාර රජු ජීවත් වී ඇත්තේ යක්ෂ සංස්කෘතියක ද යන්නත් ඔහු මෙරට ම විසූ යක්ෂ රජකු ද යන්නත් සොයා බැලිය යුතු ය.

© Prof. Nalin De Silva

එළාර රජු ජෛන ආගමිකයකු බවට ද ඇතැම්හු විශ්වාස කරති. ඇතැම් විට එසේ වන්නට ද ඇත. එළාර රජු පිළිබඳ ඇති ප්‍රධාන ම පුවතක් නම් තම යහන් ගැබේ බැඳ තිබී යැයි කියන ඝණ්ඨාර කතාව ය. යහනෙහි බැඳ තිබූ ඝණ්ඨාර ගැන උත්තර හෝ දක්ෂිණ හෝ භාරතීය සංස්කෘතියෙහි අසන්නට නො ලැබේ. එවැනි පුවත් පර්සියානු (ඉරාන) සංස්කෘතියෙහි ඇත. යක්ෂ ගෝත්‍රිකයන් මේ ප්‍රදේශයෙන් දඹදිවට හා ලංකාවට පැමිණ ඇතැයි කියැවෙයි. එළාර රජු එක්කෝ පර්සියාවෙන් හෝ අසල ප්‍රදේශයකින් හෝ පැමිණෙන්නට ඇත. නැත්නම් ලංකාවේ ම උපන් යක්ෂ කුමාරයකු විය හැකි ය. එළාර රජු සමග යුද්ධයට ගිය හැමුණු කුමරුට මහවැලි ගඟ දිගේ දෙමළ බළකොටු තිස්දෙකක් පරාජය කිරීමට සිදුවිණි යැයි මහාවංසය කියයි. එසේ ගඟ දිගේ බළකොටු තිස්දෙකක් බැඳීමට තරම් දෙමළ බලකායක් ලංකාවට පැමිණියේ කවදා ද කා සමග ද? මේ කඳවුරු අන් කිසිවකුගේ නොව යක්ෂ ගෝත්‍රිකයන්ගේ නොවිය හැකි ද? එළාර රජු ද මෙරට යක්ෂ කුමරකු හෝ පිටින් පැමිණි යක්ෂ රජකු නම් හෝ මහවැලිය අවට පදිංචි වී සිටි යක්ෂ ගෝත්‍රිකයන් ඔහුට සහාය දීම පුදුමයට කරුණක් විය නො හැකි ය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva